සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2020
Year End Evaluation

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: සිංහල සාහිත්‍ය රසාස්වාදය | පත්‍රය / வினாத்தாள் / Paper: I,II |

(01) (i) (අ) මදු රජ්ජුරුවෝ

(ආ) කුස රජතුමා / මහා බෝධිසත්වයෝ

(ii) (අ) මහත් ගුණයෙන්, ඇතකු

(ආ) සීතාවක යුගය

(iii) (අ) ලස්සන හිමවතේ මා වී පැසෙන්නේ
දුක් දෙන අලි ඇතුන් පන්නා දමන්නේ

(ආ) පැල් රකින විට, පාළුව කාන්සිය මකා ගැනීමට, වෙහෙස මහන්සි වූ විට

(iv) (අ) නංගිට

(ආ) වෙසක් පහන කෙටි කතාවෙන්

(v) (අ) යුතුකම

(ආ) ඇස් මහින්ද හිමි (ලකුණු 4 × 5 = 20)

(02) (1)
- නුවණැති ජනයා යම්තම් යහපතක් කළත් එය ගලෙහි කෙටූ අකුරක් මෙන් නොකඩවා පැවතීම.
- අප්‍රමාණ වූ ගුණයෙන් හා නුවණින් යුත් සුප්‍රකට උත්තමයන් කෙළවරක් නැති හිරිහැර වලට පාත්‍ර වූවත් දුෂ්ට සිතක් ඇති කර නොගැනීම.
- උතුම් වූ ස්ථිරසාර ගුණයෙන් යුක්ත වූ උතුමකුට මුළු මහත් සාගරයම කුඩා දිය කඩිත්තකි. මහ මේරු පර්වතය තුඹසකි. වැනි අදහස් ලියා තිබීම

(2)
- නෙළුම් මල් සවස් කාලයේ හැකිලීම.
- සඳුන් දණ්ඩ කුඩු කළත් සුවඳ පැතිරීම.
- මහ මුහුද සාගරය
- මහ මේරු පර්වතය

(3) • නුවණැති ජනයාට යම්තම් යහපතක් කළත් එය ගලෙහි කෙටූ අකුරක් මෙන් දුර්ජනයන්ට එය දියේ ඇඳි ඉරක් වගේ

- අප්‍රමාණ ගුණ ඇති උතුමන් හිරිහැර වලට පාත්‍ර වූවත් දුෂ්ට සිත් ඇති නොකර ගැනීම සඳුන් දණ්ඩ කුඩු කළත් සුවඳ නැති නොවන්නා සේ
- නරක කාලයට පැමිණෙන දුක් කරදර පැමිණෙන විට කරන ලද පව් විපාක ලබා දෙන්නා සේ නෙලුම් මල් සවසට අනිවාර්යයෙන් පරවීම.

(4) • සුභාෂිතයේ බස සරලය.

- කියවන්නාට වහා වැටහෙන සුළුය.
- දුරවබෝධ තැන් අල්පය
- බෙහෝ පැදි ලිහිල් අරුත් පල කරයි.
- තැනට උචිත අයුරින් උපමා යොදා ඇත.
- සිතට කා වදී

(5) ශබ්ද රසය හා අර්ථ රසය වශයෙන් ගෙන අනුප්‍රාසය, උපමා, රූපක අතිශයෝක්ති වැනි අලංකාර උදාහරණ සහිතව ලියා තිබීම. (ලකුණු 5 × 5 = 25)

(03) (1) එක්තරා කුල පුත්‍රයෙක් බුදු සස්නෙහි යෙදී මහණව සිටින අවධියේ පිඬුසිගා ඇවිදින විට සියලු ආභරණ වලින් සැරසුණු කාන්තාවක දැක, ඇය කෙරෙහි, ආශාවක් ඇතිව ශාසනය පිළිබඳ කළකිරී සිටීම.

(2) • හැඳ සිටි ඇඳුම් කිළිටි වීම.

- රැවුල නොකපා සිටීම.
- ඩහදිය ගැලීම.
- අවලස්සන වීම.
- ඉලිප්පුන නහර ඇතිවීම.
- සුදු මැලි වීම.
- නියපොතු වවාගෙන සිටීම, වැනි ලක්ෂණ

(3) ඒ පරිද්දෙන් ම උකටලී වූ, සිත් ව ශාසනයෙන් පිරිහෙනු කැමති භික්ෂුන්ටත් සැදෑ නැමති මල් මලානික වීමය.

(4) පැළඳි මල් මලානික වීම.
දිව සළු කිලුටු වීම.
ශරීරය දුර්වර්ණ වීම.
දෙකිහිලි වල ඩා බිඳු වැහීම.
ආලය මඳවීම. මෙම අදහස් විස්තරාත්මකව ලිවිය යුතුය. (ලකුණු 25)

<u>නැතහොත්</u>

(1) ඇතින්නක් සහ පැටවා අතර පවතින සෙනෙහස මෙය සංවාදයක් ලෙස සිදුකරන අතර ඇත් ගාලක සිදුවන සිදුවීම් හා දෙපා සතුන්ගේ (මිනිසුන්ගේ) අවගුණ සිව්පා සතුන්ගේ (අලි ඇතුන්ගේ) යහ ගුණක් ගෙන හැර දක්වයි.

(2) රළේ ඉන්නා සියලුම දරුවන්ට එකසේ ආදරය සෙනෙහස දැක්වීම, ගැහැණු සතුන් සැලකිල්ලෙන් බලාගැනීම, මිනිස් සමාජයේ ඇති නරුම ගති ලක්‍ෂණ වලට වඩා ඉහළ ගතිගුණ ඇති බව ඇත් රළේ නායකයින් තම වර්ගය රැක බලා ගැනීම.

අලි ඇතුන් මිනිසුන්ට උපකාර කල අවස්ථා (බුදුන් වහන්සේට උදව් කිරීම)

(3) ඇතින්නකට පැටවකු ලැබුණු විට ඇත් රළේ ම ඇතින්නන්ට කිරි එරෙන බව පිළිගත් සම්මතයකි.

මිනිසුන් ළඟ නැති උතුම් ගති තිරිසනුන් තුළ පවතින බව

උදාහරණ සමග ලියා තිබීම.

(4)
- මිනිසුන් අලි ඇත්තු වෙඩි තබා මරා දැමීම.
- දළ ලබා ගැනිම.
- වලිගේ කෙඳි ගැලවීම.
- එම කෙඳි මිනිසුන්ගේ ආරක්‍ෂාවට පැළඳීම.

උදාහරණ සමග විස්තරාත්මකව ලියා තිබීම. (ලකුණු 25)

## III කොටස

4, 5, 6, 7 ප්‍රශ්න සඳහා ලකුණු ක්‍රමය

උදාහරණ - ල 03

උදාහරණ පිළිතුරු හා ගැළපීම - <u>ල 12</u>

ල 15

- ප්‍රශ්නය හැඳින්වීම
- උදාහරණ 1 හා එය පැහැදිලි කිරිම.
- උදාහරණ 2, 3, පිළිතුරට සම්බන්ධ වන සේ ලිවීම.
- නිගමනය, සමාලෝචනය.

## පිරිවිතර වගුව

**සාහිත්‍ය රසාස්වාදය** **10 ශ්‍රේණිය**

| | අධ්‍යාපනික අරමුණු විෂය ක්ෂේත්‍රය / නිපුණතා මට්ටම | දැනුම | අවබෝධය | භාවිතය | විශ්ලේෂණය | සංස්ලේෂණය | ඇගයීම | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 1.0 සිංහල සාහිත්‍ය ඉතිහාසය, අර්ථාවබෝධය අවස්ථා සම්බන්ධය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය. | 01 | 01 | | | | | 02 |
| 2 | 5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රස විඳිමින් විචාරයේ යෙදීම. | | | | 01 | | | 01 |
| 3 | 2.0 - 5.0 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳීම, විචාරය<br>නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණය රසවිඳීම, විචාරය | | | 01 | | | | 01 |
| 4 | 2.0 පුරාතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳීම, විචාරය | | | | | | 01 | 01 |
| 5 | 3.0 ජන සාහිත්‍ය නිර්මාණ රසවිඳීම, විචාරය | | | | | | 01 | 01 |
| 6 | 5.0 නූතන පද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳීම, විචාරය | | | | | | | 01 |
| 7 | 3.0 නූතන ගද්‍ය සාහිත්‍ය නිර්මාණ රසවිඳීම, විචාරය | | | | 01 | 01 | | 01 |
| | එකතුව | 01 | 01 | 01 | 02 | 01 | 02 | 08 |